රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:- 315

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1985 නොවැම්බර් මස 22 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**දිවයින තුළ වැටුප් රහිත නිවාඩු සඳහා වූ අනිවාර්ය සේවා කාලය සංශෝධනය කිරීම.**

රජයේ නිලධරයකුට අධ්‍යයන කටයුතු හෝ පුහුණු කටයුතු සඳහා දෙන වැටුප් රහිත මෙරට අධ්‍යයන නිවාඩු සම්බන්ධයෙන් අනිවාර්ය සේවයක යෙදීමට පහත සඳහන් පරිදි ගිවිසුමකට එළඹිය යුතුය.

(1) වර්ෂයකට අඩු කාලයක් සඳහා අනිවාර්ය සේවා කාලයක් නොමැත.

(11) වර්ෂයක් හෝ ඊට වැඩි කාලයක වැටුප් රහිත නිවාඩු සම්බන්ධයෙන් අනිවාර්ය සේවා කාලය, වැටුප් රහිත නිවාඩු කාලය හා සමාන කාලයක් විය යුතුය.

2. අනිවාර්ය සේවා කාලය ගණන් බැලිය යුත්තේ අඛණ්ඩව සම්පූර්ණ මාසයටය.

3. ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 2 වගන්තිය යටතේ, දිවයින තුළ රාජ්‍ය සේවයෙන් පරිබාහිර සේවයක් සඳහා සේවයෙන් මුදාහරින රජයේ නිලධරයකු සම්බන්ධයෙන් ද ඉහත සඳහන් විධිවිධාන අදාළ වේ.

4. ඉහත දක්වා ඇති අනිවාර්ය සේවා කාලයන්, නිලධාරියෙකු දැනටමත් එළඹ ඇති බැඳුම්කර/ගිවිසුම් වලට ද අදාළ වනු ඇත.

Siriwardhana
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.